# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 410 / 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 08/03/2024 පැය 2005

## මාධ්‍ය නිවේදනය

**ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව "කාන්තා ආරක්ෂාව හා නීතිය " වැඩසටහන - ප්‍රජා පොලිස් කොට්ඨාසය.**

2024.03.08 වන අද දිනට යෙදී ඇති ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව "කාන්තා ආරක්ෂාව හා නීතිය " යන තේමාව යටතේ ප්‍රජා පොලිස් කොට්ඨාසය සංවිධානය කළ වැඩසටහනක් පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතාගේ ප්‍රධානත්වයෙන් අද දින උදෑසන මරදාන නාලන්දා විද්‍යාලීය ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී.

මෙහිදී පොලිස්පතිතුමා විසින් පැමිණ සිටි පිරිස අමතා සියළුම කාන්තාවන්ගේ හෙට දවසේ සුරක්ෂිතතාවය සම්බන්ධව නීතිය ක්‍රියාත්මක කිරීම හා පොලිස් නිලධාරිනියන්ගේ ගැටළු සම්බන්ධයෙන් සොයා බලා එම නිලධාරිනියන්ගේ සුභ සාධනය සම්බන්ධයෙන් කටයුතු කරන බව ප්‍රකාශ කරන ලදී.

එහිදී, කාන්තා ආරක්ෂාව හා නීතිය යන මැයෙන් ප්‍රජා පොලිස් කොට්ඨාසයේ ස්ථානාධිපති ප්‍රවීණ දේශක ප්‍රධාන පොලිස් පරික්ෂක මනෝජ් සමරසේකර නිලධාරියා විසින් විශේෂ දේශනයක් පවත්වනු ලැබූ අතර එම අවස්ථාව සඳහා නියෝජ්‍ය පොලිස්පති අපරාධ දිසාව හා පොලිස් මාධ්‍ය ප්‍රකාශක නීතිඥ නිහාල් තල්දුව මහතා ඇතුළු උසස් පොලිස් නිලධාරීන් රැසක් හා ශ්‍රී ලංකා පොලිසිය, ත්‍රිවිධ හමුදාව, පොලිස් විශේෂ කාර්ය බලකාය, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් නිලධාරිනියන් පිරිසක් සහ රෝහල් හෙද කාර්ය මණ්ඩල නිලධාරිනියන් පිරිසක් සහභාගී විය.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**